# ශ්‍රී ලංකා සංචාරක කර්මාන්ත



**“සෞභාග්‍යමත් දේශයක් උදෙසා”**

**සුසංවේද - 2022**

**ශ්‍රම වෙළඳපොළ තොරතුරු හා පර්යේෂණ අංශය**

**මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**

**සැකසුම - ආර්.එම්.ඒ.සෙව්වන්දි**

**ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය**

**(බුද්ධිකලම්භන සැසි)**

---

**අධ්‍යයනය, දත්ත විශ්ලේෂණය හා වාර්තා සම්පාදනය**

**ආර්.එම්.අප්සරා සෙව්වන්දි**
**සංවර්ධන නිලධාරී**
**ශ්‍රම වෙළඳපොල තොරතුරු හා පර්යේෂණ අංශය**

**උපදේශකත්වය**

**අනූෂා ගෝකුල ප්‍රනාන්දු**
**අධ්‍යක්ෂ ජනරාල්**
**මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**

**මෙහෙයවීම හා අධීක්ෂණය**

**බී. සුමිත් නිශාන්ත පෙරේරා**
**අධ්‍යක්ෂ (සැලසුම් හා පර්යේෂණ)**

**එල්.පී. ලලිත් ගුණරත්න**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රම වෙළඳපොල තොරතුරු හා පර්යේෂණ)**

**සංස්කරණය**

**බී. සුමිත් නිශාන්ත පෙරේරා**
**අධ්‍යක්ෂ (සැලසුම් හා පර්යේෂණ)**

**පිටු සැකසීම**

**කෝෂලා ගයාත්‍රි දෙහිගස්පිටිය**
**තොරතුරු තාක්ෂණ නිලධාරී**
**මිනිස්බල රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**

**පටුන**

01. හැඳින්වීම ........................................................................ 1

02.  පසුබිම ........................................................................ 3

03. ශ්‍රී ලංකාව සතු සම්පත් ( සංචාරක ගමනාන්ත) ....................... 6

04.  ව්‍යාපෘතියේ අරමුණ ........................................................ 13

06. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය මුහුණ දෙන ගැටලු හා......... 14

07. දෙපාර්තමේන්තුවේ අපේක්ෂාව ........................................... 18

# 01. හැඳින්වීම

ගෝලීය ආර්ථිකය තුළ ඉහළ විදේශ විනිමයක් උත්පාදනය කරන ලොව විශාලතම ව්‍යාපාර වලින් එකක් ලෙස සංචාරක ව්‍යාපාරය හඳුන්වා දිය හැකි අතර ලෝකයේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් 12% ක පමණ ප්‍රමාණයක් සංචාරක ව්‍යාපාරය මගින් උත්පාදනය කරන බව ලෝක චාරිකා සහ සංචාරක සභාව (WTTC) විසින් තක්සේරු කර ඇත. එමෙන්ම විදේශ විනිමය ඉපයීමට අමතරව සංචාරක කර්මාන්තය ආර්ථික වර්ධනයට, සේවා නියුක්තිය සහ කලාපීය ආදායම් විෂමතා අවම කිරීමටද දායකත්වයක් දක්වනු ලබයි.

1930 දශකයේ ශ්‍රී ලංකාවේ කර්මාන්තයක් වශයෙන් ආරම්භ වූ සංචාරක කර්මාන්තය වර්තමානයේ ඉහළ විදේශ විනිමයක් ලබාදෙන කර්මාන්තයක් බවට පත්වී ඇත. ශ්‍රී ලංකාවට විදේශ ප්‍රේෂණ ලැබීමේ ප්‍රධාන මූලාශ්‍රයන් අතර සංචාරක කර්මාන්තයට තෙවන ස්ථානය හිමි වේ. නමුත් අනෙකුත් මූලා උත්පාදන ක්ෂේත්‍රයන්ට සාපේක්ෂව සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම ශුද්ධ ආදායමක් ලෙස ශ්‍රී ලංකාවට ලැබේ. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය, ආර්ථික වර්ධනයට සහ තිරසාර සංවර්ධනයට ඉමහත් දායකත්වයක් ලබා දේ. එමෙන්ම 2020 වර්ෂයට පෙර සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කළ ව්‍යාපාරයක් ලෙසද හඳුන්වා දිය හැකිය. 2017 වර්ෂයේදී 2,116,407 ක්වූ සංචාරක ආගමනය 2018 වර්ෂයේදී 2,333,796 ක් විය. එය සංචාරක ව්‍යාපාරයේ ස්වර්ණමය යුගය ලෙසද හඳුන්වනු ලබයි. ඒ අනුව 2017 වර්ෂයේ සංචාරක ඉපයීම්ද එ.ජ.ඩොලර් මිලියන 3924.9 සිට 2018 වර්ෂයේදී එ.ජ.ඩොලර් මිලියන 4380.6 දක්වා ඉහල ගියේය. *( ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා)*

. "පෞද්ගලික, ව්‍යාපාරික හෝ වෘත්තීමය අරමුණු පෙරදැරිව මිනිසුන් තම සුපුරුදු වටපිටාවෙන් පිටත රටවල් හෝ ස්ථානවලට සංක්‍රමණය වන සමාජ, සංස්කෘතික සහ ආර්ථික සංසිද්ධියක්" ලෙස එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය (UNWTO) විසින් සංචාරක ව්‍යාපාරය නිර්වචනය කර ඇති අතර සංචාරකයින්ගේ පැමිණීමේ වර්ධනය රටේ ආර්ථිකයට සෘජුව මෙන්ම වක්‍රව

බලපෑම්ද ඇති කරයි. මෙරටට පැමිණෙන සංචාරකයින් හේතුවෙන් වර්තමානය තුල විවිධ සේවා හා ඒ හා බැඳුණු විවිධ සේවා නියුක්ති ක්ෂේත්‍ර බිහිවී ඇත. ඒ අනුව ප්‍රධාන වශයෙන්,

- සංචාරක හෝටල්, නිවාඩු නිකේතන හා ආපනශාලා
- පිහිණුම් හා බෝට්ටු සේවා
- සංචාරක ප්‍රවාහන සේවා
- සංචාරක මඟපෙන්වන්නන්
- විසිතුරු භාණ්ඩ හා දේශීය අත්කම් භාණ්ඩ අලෙවිය
- දේශීය වෛද්‍ය ක්‍රම හා සංස්කෘතික සේවා

ආදී විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සංචාරක ව්‍යාපාරය විහිදී යයි. ලංකාවේ වසර පුරාම පවතින සම ශීතෝෂ්ණ දේශගුණයද මෙහිලා වෙසෙසින්ම අවධානයට පාත්‍ර වී තිබේ. ශ්‍රී ලංකාවේ සොබා සෞන්දර්ය, වනාන්තර, දිය ඇළි, ගංඟා, ඇළ දොළ, වන සතුන්, මල්, පලතුරුවලින් යුත් ජෛව විවිධත්වය මෙන්ම විවිධ ජාතීන් හා ආගමිකයින් එක්ව සාමූහිකව ගෙවන සාමකාමී ජන දිවිය, ඓතිහාසික හා ආගමික සංස්කෘතික උරුමයන් යන සියල්ලම සංචාරක ආකර්ශනයට හේතු කාරණා වී තිබේ.

**<u>සංචාරකයින් විසින් ශ්‍රී ලංකාව ගමනාන්තයක් ලෙස තෝරා ගැනීමට හේතු</u>**

- ස්වභාව සෞන්දර්යය නැරඹීම
- ආයුර්වේද ප්‍රතිකාර
- සංස්කෘතිකාංග නැරඹීම
- ඓතිහාසික ස්ථාන නැරඹීම
- විනෝද ක්‍රීඩා
- ව්‍යාපාරික කටයුතු
- සම්මන්ත්‍රණ
- මුහුදු වෙරළ හා හිරු රැස්
- නෑදෑ හිත මිතුරන් ආදි හේතු නිසා ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණීම වර්ධනය වී ඇත.

ශ්‍රී ලංකාව “ලෝකයේ හොඳම සංචාරක ගමනාන්තය” ලෙස 2019 වර්ෂයේ දී Lonely planet සඳහන් කරයි. (ලෝන්ලි ප්ලැනට් සඟරාව- කතුවර ඊතන් ගෙල්බර් (Ethan Gellber) “The best in travel 2019” නම් කෘතිය) ලොව හොඳම සංචාරක ගමනාන්තය බවට පත්වන්නට ශ්‍රී ලංකාව සමත් වූ ප්‍රධාන කරුණු ලෙස හොඳ ප්‍රවාහන පහසුකම් හා සේවා සම්බන්ධතා, ජගත් කීර්තියට පත් උසස් මට්ටමේ නව හෝටල් පහසුකම් හා රට තුළ ලබාගත හැකි සංචාරක අත්දැකීම්වල විවිධත්වය යන්නයි. ලෝක සංචාරකයන් අතර පතළ කීර්තියක් දිනා ඇති දේශගුණික හා රටවල පවතින භූ විෂමතාවන් පිළිබඳ කාලීන පුළුල් තොරතුරු ගෙන එන නැෂනල් ජියෝග්‍රැෆික් (National Geographic) සඟරාව ද 2018 වසරේ අගභාගයේ දී වාර්තා කළේ “ශ්‍රී ලංකාව ලෝකයේ සංචාරය සඳහා වඩාත්ම සුදුසු කාලගුණික හා දේශගුණික තත්ත්වයන් සහිත රට” ලෙසයි.

## 02. පසුබිම

වර්තමානය තත්ත්වය තුල අභියෝගාත්මක දේශීය සමාජ, දේශපාලන, පාරිසරික බලපෑම් මධ්‍යයේ වුවද ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉහළ විදේශ විනිමයක් ලබා ගැනීමට සංචාරක අංශය උත්තේජනයක් සපයන බව හඳුනාගෙන ඇත. සංචාරක කර්මාන්තයේ නව සාමාන්‍යයකට අනුවර්තනය වීමට පමණක් නොව නව සාමාන්‍යකරණයක් නිර්මාණය කිරීමට රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශය දරන ප්‍රයත්නය අතිමහත්ය.

**සංචාරක පැමිණීම , ආදායම (ඇ.ඩො.මි) හා සේවා නියුක්තිය**


| වර්ෂය | සංචාරක පැමිණීම | ආදායම (ඇ.ඩො.මි) | සේවා දායකත්වය | |
|---|---|---|---|---|
| | | | සෘජු | වක්‍ර |
| 2010 | 654,476 | 575.9 | 55,023 | 77,032 |
| 2011 | 855,975 | 838.9 | 57,786 | 80,899 |
| 2012 | 1,005,605 | 1038.3 | 67,862 | 95,007 |
| 2013 | 1,274,593 | 1715.5 | 112,550 | 157,600 |
| 2014 | 1,527,153 | 2431.1 | 129,790 | 170,100 |
| 2015 | 1,798,380 | 2980.6 | 135,930 | 183,506 |
| 2016 | 2,050,832 | 3518.5 | 146,115 | 189,544 |
| 2017 | 2,116,407 | 3924.9 | 156,369 | 202,846 |
| **2018** | **2,333,796** | **4380.6** | **169,003** | **219,484** |
| 2019 | 1,913,702 | 3606.9 | 173,592 | 229,015 |
| 2020 | 507,704 | 682.5 | 175,990 | 171,767 |
| 2021 | 194,495 | 506.9 | 177,476 | 180,451 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

2019 වසරේ ඉරු දින සිදු වූ පාස්කු ප්‍රහාරයෙන් දැඩි ලෙස සංචාරක කර්මාන්තය පසුබෑමට ලක් වූ අතර සංචාරකයින්ගේ පැමිණීම දැඩිව පහළ වැටුණි. 2019 වසරේදී මෙරටට පැමිණි සංචාරක ප්‍රමාණය 1,913,702 ක් වූ අතර ඉපයූ ආදායම ඇ.ඩො.මිලියන 3606.9 ක් විය. එය 2016, 2017, 2018 වර්ෂ වලට සාපේක්ෂව අඩු ප්‍රවනතාවයකි. *(ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය- වාර්ෂික වාර්තා)* 2018 වර්ෂයේදී වැඩිම සංචාරකයින් පැමිණ ඇත්තේ ඉන්දියාවෙනි.කෝවිඩ් -19 වසංගතය පැතිරීමත් සමඟ 2020 වර්ෂය තුල සංචාරක සේවා ඉපයීම්හි විශාල පසුබෑමක් වාර්තා විය. 2020 වසර තුල පැමිණි සංචාරකයින්ගේ පැමිණීම 507,704 ට සීමා වූ අතර පෙර වසරට සාපේක්ෂව 73.5 කින් පහළ වැටීමක් වාර්තා කළේය. සංචාරකයින්ගේ පැමිණීම මත පදනම්ව ඇස්තමේන්තු කෙරෙන සංචාරක ඉපයීම් 2020 වසරේදී එ.ජ.ඩොලර් මිලියන 682 ක් දක්වා එ.ජ.ඩො.මි. 2924.4 කින් විශාල අඩුවීමක් සිදු විය. එය

පෙර වර්ෂයට සමගාමීව 81.1 ක පහළ බැසීමකි. 2021 වසරේදී විදේශීය සංචාරකයින්ගේ පැමිණීම 194,495 ක් වූ අතර එම වර්ෂයේ ලැබූ ආදායම එ.ජ.ඩොලර් මිලියන 506.9 ක් විය.

**2019 – 2021 වර්ෂ දක්වා සංචාරක කර්මාන්තයෙන් ඉපැයූ මුළු ආදායම පහත දක්වා ඇති ප්‍රස්තාරය ආශ්‍රයෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය එම වසර තුල පසුබෑමට ලක් වී ඇති ආකාරය පැහැදිලි වේ.**




මූලාශ්‍ර - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මාසික වාර්තා අනුව 2022 වර්ෂයේ පෙර වර්ෂයන්ට වඩා සංචාරකයින්ගේ පැමිණීම ඉහළ මට්ටමක පවතින බව පෙන්නුම් කෙරේ. 2022 වර්ෂයේ වැඩිම සංචාරකයින් පැමිණීම වාර්තා වන්නේ මාර්තු මාසයේය. එය 106,500 කි. අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් 37,760 ක් වාර්තා වේ. මාර්තු මාසයට සාපේක්ෂව 65.5% කින් පහත වැටී ඇත. නමුත් 2022 වර්ෂයේ සංචාරක පැමිණීම් ක්‍රම ක්‍රමයෙන් වැඩි වන බව හඳුනාගැනීමට හැකිවේ. ඒ බව ජනවාරි සිට අගෝස්තු දක්වා 496,430 ක සංචාරක ආගමනය මගින් පැහැදිලි වේ.

2022 වර්ෂයේ සංචාරක පැමිණීම

| මාසය | සංචාරක පැමිණීම |
|---|---|
| ජනවාරි | 82,327 |

| | |
|---|---|
| පෙබරවාරි | 96,507 |
| මාර්තු | 106,500 |
| අප්‍රේල් | 62,980 |
| මැයි | 30,207 |
| ජූනි | 32,856 |
| ජූලි | 47,293 |
| අගෝස්තු | 37,760 |
| **එකතුව** | **496,430** |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

සංචාරක කර්මාන්තය වසරේ ඕනෑම කාල සීමාවක යම් දේශයක් තුල ඇතිවන ස්වාභාවික ආපදා, සිවිල් කෝලාහල සහ දේශපාලන නොසන්සුන්තා ආදී හේතූන් මත බලපෑම් වලට ලක් වන සංවේදී කර්මාන්තයක් වුවත් විදේශ විනිමය උත්පාදනය කළහැකි ව්‍යාපාරයකි. එමෙන්ම නව රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් බිහි කළ හැකි ව්‍යාපාරයක්ද වේ. සමස්තයක් ලෙස රටක ආර්ථික සංරචක වලට සාපේක්ෂව සංචාරක කර්මාන්තය තුලින් ලැබෙන ප්‍රතිලාභ වෙනස් වුවත් සංචාරක කර්මාන්තය රටේ ආර්ථික සංවර්ධනයේ ගාමක බලවේගයක් ලෙස ක්‍රියාත්මක වේ.

## 03. ශ්‍රී ලංකාව සතු සම්පත් ( සංචාරක ගමනාන්ත)

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට වටිනාකමක් ඇති වීමට ස්වාභාවික සම්පත්, මානව සම්පත් මෙන්ම භෞතික සම්පත් ඉවහල් වී ඇත. සිත්ගන්නා සුළු සුන්දර වෙරළ තීර, වනාන්තර, දිය ඇලි, දුර්ලභ ගණයේ සත්ව විශේෂ, සංස්කෘතික වටිනාකමින් පොහොසත් දායාදයන්, දේශීය ආහාරපාන, දර්ශනීය ස්ථාන, අධිවේගී මාර්ග සහ නිදහස් පරිසරය යනාදි වේ.

# පළාත් අනුව පිහිටි සුන්දර ගමනාන්ත

## උතුරු පළාත

- නල්ලූර් කෝවිල
- යාපනයේ චුන්දිකුලම් ජාතික වනෝද්‍යානය
- කීරමලෙයි පූජනීය ජල උල්පත්
- ඩෙල්ෆ් දූපත
- යාපනයේ කන්කසන්තුරේ වෙරළ තීරය
- යාපනයේ වැඩෙන ගල්
- වරතරාජ පෙරුමාල් පන්සල
- නාග පූෂානි අම්මාන් පන්සල
- දඹකොළ පටුන විහාරස්ථානය
- ඩෙල්ෆට් ලන්දේසි බලකොටුව
- යාපනය පුස්තකාලය
- ජේදුරුතුඩුව ප්‍රදීපාගාරය
- යාපනය පුරාවිද්‍යා කෞතුකාගාරය
- යාපනය කොටුව
- නාගදීපය
- මඩු දේවස්ථානය
- සරසාලෙයි කඩොලාන පරිසර පද්ධතිය

## උතුරුමැද පළාත

- අටමස්ථාන
- පුරාණ අනුරාධපුර තාරකා දොරටුව
- මිහින්තලය
- ගිරිතලේ
- දිඹුලාගල
- රාජාංගනය
- විල්පත්තුව ජාතික වනෝද්‍යානය
- පොළොන්නරුව වටදාගේ
- පරාක්‍රමබාහු ප්‍රතිමාව- පොළොන්නරුව
- පෞරාණික ගල් පිළිම
- තිසා වැව
- ඇත් පොකුණ
- ඉසුරුමුණිය
- වෙස්සගිරිය බෞද්ධ ආරණ්‍ය සේනාසනය
- කළුදිය පොකුණ-මිහින්තලය
- සමාධි ප්‍රතිමාව
- අවුකන පිළිමය
- සඳකඩ පහන
- ලංකාරාමය

- අභයගිරි කෞතුකාගාරය
- බසවක්කුලම වැව
- කලා වැව
- කුට්ටම්පොකුණ
- වටදාගෙය
- හැටදාගෙය
- රන්කොත් වෙහෙර
- තිවංක පිළිමගෙය
- ගල් විහාරය
- පරාක්‍රමබාහු මාලිගාව
- පරාක්‍රමබාහු ප්‍රතිමාව
- පරාක්‍රම සමුද්‍රය
- පොළොන්නරු කෞතුකාගාරය
- ලංකාතිලක විහාරය
- නිශ්ශංක ලතාමණ්ඩපය
- නෙළුම් පොකුණ-පොළොන්නරුව
- සත්මහල් ප්‍රසාදය
- පබළු වෙහෙර
- පොත්ගුල් වෙහෙර
- රන්කොත් වෙහෙර
- ශිව දේවාල පන්සල
- ගල්පොත ශිලා ලිපිය
- වස්ගමුව ජාතික වනෝද්‍යානය
- අංගම්මැඩිල්ල ජාතික වනෝද්‍යානය
- සෝමාවතිය

වයඹ පළාත

- යාපහුව
- ආනවිලුන්දා කුරුළු අභය භූමිය
- මුන්නේශ්වරම් කෝවිල-හලාවත
- ඇතුගල-කුරුණෑගල
- කල්පිටිය බලකොටුව
- දැදුරු ඔය ජලාශය
- තබ්බෝව වැව

ඌව පළාත

- කතරගම පුදබිම
- රාවණා ගුහාව

- බඹරකන්ද දිය ඇල්ල
- දුන්හිඳ ඇල්ල
- රාවණා ඇල්ල
- ඇල්ල
- බෝගොඩ ලී පාලම
- ඇඩිශම් බංගලාව
- ආරුක්කු 9 පාලම
- Little Adams pear
- දියලුම දිය ඇල්ල
- මාදුරුඔය රක්ෂිතය

## දකුණු පළාත

- ගාලුකොටුව
- බෙන්තොට වෙරළ
- රූමස්සල
- පරවී දූව
- හුම්මානය
- කැස්බෑවුන් නැරඹීම හා සංරක්ෂණ මධ්‍යස්ථාන
- යාල ජාතික වනෝද්‍යානය
- සීනිගම දේවාලය
- මාර්ටින් වික්‍රමසිංහ කෞතුකාගාරය
- තල්මසුන් නැරඹීම-ගාල්ල,මිරිස්ස,උණවටුන
- පොල්හේන වෙරළ-මාතර
- මාදු ගඟ fish therapy හා කඩොලාන පරිසරය

## සබරගමු පළාත

- ශ්‍රීපාදස්ථානය
- බෝපත් ඇල්ල
- පින්නවල අලි අනාථාගාරය
- සිංහරාජ
- Water rafting - කිතුල්ගල
- උඩවලව ජාතික වනෝද්‍යානය
- කිරිදි ඇල්ල
- සමනල වැව වේල්ල
- රත්නපුර මැණික්
- බෝපත් ඇල්ල
- ගාට්මෝර් දිය ඇල්ල
-

## බස්නාහිර පළාත

- Galle face
- දෙහිවල සත්වෝද්‍යානය
- සීතාවක උද්භිත උද්‍යානය
- විහාරමහාදේවී උද්‍යානය
- ආකේඩ් නිදහස් චතුරශ්‍රය
- ජාතික කෞතුකාගාරය
- කැළණිය රජමහා විහාරය
- ගංගාරාමය
- බෙල්ලන්විල
- දියත උයන
- නෙළුම් කුලුණ
- Water world lanka-කැළණිය
- ගල්කිස්ස වෙරළ
- මීගමුව
- රතු පල්ලිය
- බැද්දේගාන තෙත්බිම් උද්‍යානය

## මධ්‍යම පළාත

- දළදා මාලිගාව
- සෙම්බුවත්ත වැව-මාතලේ
- හෝර්ටන් තැන්න
- තේ හා ස්ටෝබරි වතු
- හග්ගල උද්භිද උද්‍යානය
- පේරාදෙණිය උද්භිද උද්‍යානය
- රිවස්ටන් සහ පිටවල පතන - මාතලේ
- සීගිරිය
- පිදුරංගල
- වික්ටෝරියා වේල්ල
- ලෝක බෞද්ධ කෞතුකාගාරය
- ඇබර්ඩීන් දිය ඇල්ල
- ලක්ෂපාන දිය ඇල්ල
- ශාන්ත ක්ලේයාර් දිය ඇල්ල
- සේරා ඇල්ල - මාතලේයාරි ඇල්ල - මාතලේ
- අලු විහාරය-මාතලේ
- නුවරඑළිය හා අවට පරිසරය

## නැගෙනහිර පළාත

- නිලාවේලි මුහුදු තීරය
- කෝනේශ්වරම් දේවාලය

- අරුගම්බේ මුහුදු තීරය
- උණුවතුර ළිං-ත්‍රිකුණාමලය
- කන්තලේ වැව
- ලාහුගල කිතුලාන ජාතික උද්‍යානය
- කුමන ජාතික වනෝද්‍යානය
- කින්නියා පාලම
- මාදුරුඔය රක්ෂිතය

## දුම්රිය චාරිකා

- කොළඹ සිට මහනුවර හා බදුල්ල දක්වා දුම්රිය මාර්ග
- කොළඹ සිට මාතර
- කොළඹ සිට යාපනය
- කොළඹ සිට ත්‍රිකුණාමලය
- කොළඹ සිට මඩකලපුව
- කොළඹ සිට බදුල්ල - Ella odyssey

## සංස්කෘතිකාංග දර්ශන

- මහනුවර ඇසළ පෙරහැර
- නල්ලූර් කන්දසාමි කෝවිල් උත්සවය
- කතරගම පෙරහැර
- සමන්දේවාල පෙරහැර
- කැළණි පෙරහැර
- ගංගාරාම පෙරහැර
-

## සුවතා සංචාරක ව්‍යාපාර

- Santani wellness Resort-මහනුවර
- Karunakarala Ayurveda Resort- මීගමුව
- Ulpotha wellness Retreat-
- ත්‍රි- කොග්ගල
- අදිත්‍ය සුවතා මධ්‍යස්ථානය - අනුරාධපුරය
- සෙන්සුවතා අභය භූමිය-නෙටොල්පිටිය,තංගල්ල
- මහනුවර සමාධි මධ්‍යස්ථානය
- සිද්ධාලේප ආයුර්වේද සෞඛ්‍ය නිකේතනය-වාද්දුව

## ශ්‍රී ලංකාවේ සර්ෆ් ක්‍රීඩා ස්ථාන

- අරුගම්බේ සර්ෆ්
- හික්කඩුව සර්ෆ්
- උණවටුන බොක්ක

- මිදිගම සර්ෆ් ස්පෝට්ස්
- අහංගම සර්ෆ් ස්පෝට්ස්
- වැලිගම සර්ෆ් ස්පෝට්ස්
- මිරිස්සේ රළ පැදීම
- හිරිකැටිය සහ මිරිස්ස නැගෙනහිර සර්ෆින්
- තලල්ල බොක්ක
- ආරුගම් බොක්ක
- පොතුවිල් තුඩුව
- විස්කි පොයින්ට් - පොතුවිල්
- ඕකන්ද සර්ෆ් පොයින්ට්

## යාල හොඳම නිවාඩු නිකේතන

- වයිල්ඩ් කෝස්ට් කූඩාරම් ලැගුම්හල
- Uga chena huts
- Eco කණ්ඩායම විසින් Mahoora Safari කූඩාරම්
- කුරුළුවල්
- ජෙට්වින්ග්
- තරු විලාස්
- Leopard safaris yala by kk collection
- ලයා සෆාරි
- දිවි කූඩුව
- දිවියන්ගේ මංපෙත්
- Jetwing safari camp

## අධිවේගී මාර්ග පහසුකම්

- දක්ෂිණ අධිවේගී මාර්ගය
- පිට රවුම් අධිවේගී මාර්ගය
- කොළඹ කටුනායක අධිවේගී මාර්ගය
- මීරිගම - කුරුණෑගල අධිවේගි මාර්ගය

යුනෙස්කෝ සංවිධානය මගින් නම් කෙරුණු ලෝක උරුමයන් ලෙස ශ්‍රී ලංකාවේ සංස්කෘතික ත්‍රිකෝණයට අයත් නගර

- පොළොන්නරුව
- අනුරාධපුරය
- මහනුවර
- සීගිරිය
- දඹුල්ල

## 04. ව්‍යාපෘතියේ අරමුණ

වර්තමානයේ සංචාරක ක්ෂේත්‍රය තුල පවතින සංවර්ධන අවස්ථා, ගැටලු හා විසඳුම් හඳුනාගෙන ඒ තුලින් තිරසාර ලෙස සංචාරක කර්මාන්තය සංවර්ධනයට අදාල යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 05. ක්‍රමවේදය

සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන රාජ්‍ය හා පෞද්ගලික ආයතන බුද්ධි කලම්භන සැසියට ආරාධනා කොට සහභාගී කර ගන්නා ලදී.

**<u>සහභාගී වූ ආරාධිත ආයතන</u>**

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
- ජාත්‍යන්තර කම්කරු සංවිධානය
- ඌව පළාත් සභාව
- ශ්‍රී ලංකා කුඩා හා මධ්‍යම සංචාරක ව්‍යවසායක සංගමය
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
- ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
- ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය
- ජාතික උද්භිත උද්‍යාන දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා මහ බැංකුව
- යොවුන් සේනාංකය
- හෝටල් හිමියන්ගේ සංගමය
- සිවිල් ගුවන් සේවා අධිකාරිය
- ශ්‍රී ලංකා සබරගමු විශ්ව විද්‍යාලය
- මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව (NHRDC)
- ශ්‍රී ලංකා රියදුරු සංචාරක මාර්ගෝපදේශ සංගමය
- හෝටල් සැපයුම්කරුවන්ගේ සංගමය
- ස්වාධීන සෆාරි ජීප් රථකරුවන්ගේ සංගමය
- ලංකා සංචාරක රියදුරන් සහයක සංගමය
- ශ්‍රී ලංකා වෘත්තීය සම්මන්ත්‍රණ ප්‍රදර්ශන සහ උත්සව සංවිධායකයින්ගේ සංගමය
- ශ්‍රී ලංකා පරිසර සංචාරක සංගමය
- ජාතික සංචාරක මාර්ගෝපදේශක කථිකාචාර්යවරුන්ගේ ශ්‍රී ලංකා ආයතනය (SLINTGL)
- ශ්‍රී ලංකා හෝටල් සංගමය (THASL)
- සංචාරක සේවා සපයන්නන්ගේ සංගමය
- සංචාරක මාර්ගෝපදේශක කථිකාචාර්ය සංගමය
- ලංකා හෝටල් පාසල් උපාධිධාරී සංගමය
- සංචාරක හා කර්මාන්ත මණ්ඩලය

- සූපවේදීන්ගේ සංසදය
- සංස්කෘතික ත්‍රිකෝණ හෝටල් හිමියන්ගේ සංගමය
- ශ්‍රී ලංකා නැගෙනහිර වෙරළ හෝටල් හිමියන්ගේ සංගමය
- සංචාරක කර්මාන්ත වෘත්තිකයන් සඳහා ජාතික සංගමය
- ශ්‍රී ලංකා සංචාරක සන්ධානය
- ශ්‍රී ලංකා සංචාරක නියෝජිත සංගමය (TAASL)
- ශ්‍රී ලංකා සංචාරක රියදුරන්ගේ ඒකකය

## 06. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය මුහුණ දෙන ගැටලු හා විසඳුම් යෝජනා හා නිර්දේශ

| අනු අංකය | ගැටලු | පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන ලද විසඳුම් |
|---|---|---|
| 01 | සංචාරකයින් ප්‍රවාහනය සඳහා ඉන්ධන අර්බුදය | ඉන්ධන පිරවුම් හල් අසල පෝලිම් වල නොසිට ප්‍රමාදයකින් තොරව ක්‍රෙඩිඩ් කාඩ් මගින් හා NRFC ගිණුමක් ආරම්භ කර එමගින් ඩොලර් වලින් මුදල් බැර කර ඉන්ධන ලබා ගැනීමට හැකි ක්‍රමවේදයක් සලසා දීම. |
| 02 | සංචාරක මඟ පෙන්වන්නන්, රියදුරන් වැනි සංචාරක ක්ෂේත්‍රයේ නිරත වන පිරිස් හට විදේශ මුදල් පහසුවෙන් මාරු කරගැනීමට නෛතික හා පහසු ක්‍රමවේදයක් නොමැති වීම. | රාජ්‍ය හා පෞද්ගලික බැංකු ක්ෂේත්‍ර තුල විදේශ මුදල් ලංකාවේ ගිණුම් වලට පහසුවෙන් ලබා ගැනීමට හැකි ක්‍රමවේදයක් සකස් කිරීම. |
| 03 | සංචාරක ව්‍යාපාරයේ යෙදෙන පිරිස්හට විධිමත් විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් නොමැති වීම. | මෙම අංශයේ රැකියා ස්ථිර නොමැති අතර සේවක අර්ථසාධක අරමුදලේ හෝ සේවක භාරකාර අරමුදල් ප්‍රතිලාභ හෝ විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් හඳුන්වා දීම. |
| 04 | නිපුණතාවයන් හිඟවීම.<br>සංචාරක ක්ෂේත්‍රයේ රැකියාවල නිරත සමහර පිරිස් කෙදිනකවත් පුහුණුවක් ලබා නොමැත. ඔවුන් විසින් ක්ෂේත්‍රයට කරන හානිය ඉතා විශාල වේ. | වෘත්තීය පුහුණුව ලබා දීම.<br>දැනට ක්ෂේත්‍රයේ නිරත කිසිදා පුහුණුවක් හෝ බලපත්‍රයක් නොමැති අය සඳහා පළාත් සභා සංචාරක අධිකාරීන් යටතේ පුහුණුව ලබාදීම හා බලපත්‍ර නොමැති අය සඳහා නීති මගින් කටයුතු කිරීම. |
| 05 | ප්‍රමාණවත් පරිදි යටිතල පහසුකම් නොමැතිවීම.<br>ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා වැදගත් අංගයක් වන යටිතල පහසුකම් අවම වීම බරපතල ගැටළුවකි. නවාතැන් පහසුකම්,බැංකු පහසුකම්, ප්‍රවාහන පහසුකම් ඇතැම් තැන්වල අවම මට්ටමක පවතී. සුපිරි හෝටල්, මහාමාර්ග පද්ධති , අධිවේගී මාර්ග ප්‍රධාන නගරවල කේන්ද්‍රගතවී ඇති බැවින් ග්‍රාමීය ප්‍රදේශ තුල මෙම පහසුකම් නොමැති වීම සංචාරක ක්ෂේත්‍රයට ගැටලුවක් වී ඇත. ප්‍රධාන ගමනාන්ත අතර මාර්ගාසන්නයේ | • සුළු පරිමාණ ආයතන ප්‍රමිතියට ලක් කිරීම/ සමාලෝචනය පළාත් මට්ටමේ සංචාරක අධිකාරීන් වෙත බලය පැවරීම.<br>• මාර්ගාසන්නයේ සනීපාරක්ෂක පහසුකම් සැපයීම හා පළාත් පාලන ආයතනවල වගකීමක් ලෙස පැවරීම. |

| | | |
|---|---|---|
| | සනීපාරක්ෂක පහසුකම් සපයන “පහසුකම් මධ්‍යස්ථාන”(comport center) පිහිටුවා නොමැත.<br>උදා:- කොළඹ-ගාල්ල/මාතර අතරමැදි ස්ථාන<br>කොළඹ-නුවර<br>කොළඹ-අනුරාධපුර මෙම තත්ත්වය ගමනාන්ත අතරමඟ පවතින නව ගමනාන්ත හෝ අප්‍රකට ගමනාන්ත ප්‍රවර්ධනයට බාධාවකි. | |

| අනු අංකය | ගැටලු | පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන ලද විසඳුම් |
|---|---|---|
| 06 | වත්මන් තරුණ පරපුර හා කාන්තා දායකත්වය සංචාරක ක්ෂේත්‍රයේ රැකියාවන් සඳහා වැඩි නැඹුරුවක් නොමැති වීම.<br><br>ශ්‍රී ලංකාවේ තරුණ පිරිස් වැඩි වශයෙන් සුදුකරපටි රැකියාවන් සඳහා කැමැත්තක් දැක්වීම කනගාටුවට කරුණකි. විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රයේ රැකියා සඳහා කාන්තා දායකත්වය අඩු මට්ටමක පවතී. | • කාන්තාවන් රැකියා සඳහා ආකර්ශනය කරගැනීමට සමාජ ආකල්පවල වෙනසක් හා දැනුවත්භාවය වැඩි කිරීම සිදු කළ යුතුය.<br>• ක්ෂේත්‍රය හඳුන්වා දීමේ හා ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන් පාසල් සිසුන් සඳහා හඳුන්වාදීම හා සංචාරක හෝටල් ආශ්‍රිතව පුහුණු වැඩසටහන් පැවැත්වීම.ඒ සඳහා ප්‍රතිපාදන සංචාරක කර්මාන්තයේ ආයතනවල සමාජ වගකීම් පිරිවැය (CSR) වැඩසටහන් මගින් සපයා ගැනීමට හැකියාව ඇත. |
| 07 | සංචාරකයන් සඳහා අප රටේ ආරක්ෂාව අවම මට්ටමක පැවතීම.<br>2019 වර්ෂයේ මුහුණ දුන් පාස්කු ප්‍රහාරය හේතුවෙන් සංචාරකයින් එම ප්‍රහාරයට ලක්වීමත්, කාන්තා සංචාරක පිරිස් හට විවිධ කරදර, හිංසනයන් වලට ලක් වේ. | සංචාරක පොලීසිය දැනටමත් පිහිටුවා ඇති අතර හිංසනයන් සිදු කරන පිරිස් හට තදින්ම නීති බලාත්මක කර ක්‍රියාත්මක කිරීම. |
| 08 | පාරිසරික වශයෙන් වැදගත් වන කලාප හා ස්ථාන විනාශ වීමේ අවධානමකට ලක් වීම.<br>ශ්‍රී ලංකාව ස්වාභාවික සම්පත් වලින් පෝෂණය වී තිබීම භාග්‍යයකි. නමුත් සංචාරකයින් ගෙන්වා ගැනීම අරමුණු කොට ගෙන පාරිසරික වටිනාකමින් යුත් කලාප තුල හෝටල් ඉදිකිරීම , රථ වාහන එම කලාප තුලට ධාවනය කිරීම හේතුවෙන් එම පරිසර පද්ධති විනාශ වී යාම දක්නට ලැබේ. | • ශ්‍රී ලංකාවේ සංචාරක පරිසර පද්ධති ආරක්ෂා කර ගැනීම හා පරිසරයට හානි පමුණුවන පිරිස් හට නීතිය ක්‍රියාත්මක කිරීම.<br>• දේශීය සංචාරකයින් මගින් සිදුවන හානි සාපේක්ෂව වැඩි මට්ටමක පවතින හෙයින් දේශීය සංචාරකයින් දැනුවත් කිරීම හා පාලන ප්‍රමිතීන් (Control measures) හඳුන්වා දීම. |

**යෝජනා හා නිර්දේශ**

- සංචාරක ක්ෂේත්‍රයට අදාළව පවතින ආයතන ව්‍යුහය සමෝධානිකව කටයුතු කිරීම

- පරිපූර්ණ සංචාරක තොරතුරු පද්ධති ස්ථාපනය කිරීම.

කඳු නැගීම, කඳවුරු බැඳීම, බයිසිකල් පැදීම, බෞද්ධ ස්ථාන ගමනාන්ත, සංචාරක ආකර්ශන ස්ථාන, වනජීවී ස්ථාන වැනි තොරතුරු සහිත වෙබ් අඩවි හා ජංගම තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම.

- තිරසාර පරිසර හිතකාමී සංචාරක ක්ෂේත්‍රයක් බිහි කිරීම.
  සංචාරක ප්‍රදේශ තිරසාර ලෙස සංවර්ධනය කිරීම හා බලශක්තිය , ප්‍රතිචක්‍රිකරණය කිරීම, නගර පවිත්‍රතාවය සහ සුවතාවය පවත්වා ගැනීමට කටයුතු දියත් කිරීම.

- සංචාරක ක්ෂේත්‍රයේ දියුණුව සඳහා විසඳුම් හා තීරණ ගැනීමේදී බිම් මට්ටමේ ප්‍රජාවගේ සහය ලබා ගැනීම.

- කාර්යක්ෂම සංචාරක සේවාවන් සහ සංචාරක කර්මාන්තයේ ප්‍රමිතිය ඉහළ නැංවීම.
  සංචාරක සේවා සපයන්නන් ලියාපදිංචිය කිරීම හා මහජන සබඳතා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම.

- සංචාරක මහපෙන්වන්නන් සඳහා ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය වැඩි කිරීම හා හඳුන්වාදීම.

- ග්‍රාමීය ප්‍රදේශ තුල පවතින දැනටමත් අනාවරණය නොවූ නව සංචාරක ගමනාන්ත ප්‍රවර්ධනය හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් වර්ධනය කිරීම.

- සංචාරක කර්මාන්තයේ ආරක්ෂාව සහ ආචාර ධර්ම වැඩි දියුණු කිරීම අත්‍යාවශ්‍ය වන අතර එසේ නොකිරීමෙන් රටෙහි යහපත් ප්‍රතිරූපය බිඳ වැටීමට හේතු වන බැවින් නීති දැඩි කිරීම මෙන්ම නීති අනුගමනයද විධිමත් විය යුතුය.

- නව මානයන් ප්‍රවේශයක අවශ්‍යතාවය.

සංචාරකයින් සඳහා බස්රථ, දුම්රිය, කුලීරථ සහ හෝටල් වෙන්කිරීම, දුරකථන සම්බන්ධතා, අන්තර්ජාල පහසුකම්, සංචාර සැලසුම් ආදි වූ පුළුල් පරාසයක පැතිරෙන පරිදි සංචාරකයින් හා සම්බන්ධ සේවාවන් සැපයීම ආකර්ශනීය ලෙස පවත්වා ගැනීමට උත්සාහ ගැනීම.

- සංචාරක ක්ෂේත්‍රයට අදාලව වැඩසටහන් පැවැත්වීමේදී එම වැඩසටහන් භාෂා තුනෙන්ම පැවැත්වීම.
- ඉහළ ආදායම් සහ ඉහල වියදම් සිදුකරන සංචාරකයින් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට කටයුතු කිරීම.
- රටතුල සාමකාමී වතාවරණයක් ඇති කිරීමට කටයුතු කිරීම.

- දැනට තිබෙන සම්පත් වලින් ප්‍රයොජන ගැනීම.
කෘෂිකාර්මික කටයුතු ආශ්‍රිතව සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා රටතුල විශාල විභවතාවයක් පවතී.
- සුවතා සංචාරක ක්‍රමවේදයන් හඳුන්වා දීම.

ආයුර්වේදය හා පාරම්පරික හෙළ වෙදකම උරුමය කරගත් ශ්‍රී ලංකාව ලෝකයේ විශේෂ ස්ථානයක් දිනා ගෙන සිටී. ඒ අනුව ඖෂධීය ශාක සහ ඒවායේ ගුණාංග හඳුන්වා දීම, ශාක රෝපණය කිරීම දක්නට සැලැස්වීම, එම ශාක උද්‍යානයක් ලෙස ප්‍රදර්ශනය කිරීම වැදගත්ය.

- ත්‍රාසජනක ක්‍රීඩා ප්‍රවර්ධනය කිරීම.
- පුළුල් පරාසයක් තුල ක්‍රීඩා කිරීමට ස්ථාන ආරම්භ කිරීමේ හැකියාව ශ්‍රී ලංකාව තුල පවතී. 2020 මාර්තු මාසයේ පැවති සර්ෆ් ක්‍රීඩා තරඟය විදේශීය සංචාරකයින්ගේ ආකර්ශනයට ලක්විය.

## 07. දෙපාර්තමේන්තුවේ අපේක්ෂාව

ශ්‍රම වෙළඳපොල තුල ව්‍යවසායක අවස්ථා බහුල වශයෙන් පවතින බැවින් සේවා නියුක්තිය හා ආදායම් උත්පාදන හැකියාවන් වර්ධනය කිරීමට සුදුසු ව්‍යවසායකයින් වෙත හඳුන්වාදීම ඉලක්ක කරගත් පර්යේෂණ වැඩසටහනක එක් ප්‍රතිඵලයක් ලෙස මෙම වාර්තාව ඉදිරිපත් කරන අතර එය ඔබේත් රටේත් උන්නතිය උදෙසා මෙවැනි අවස්ථා භාවිතා කරනු ඇතැයි මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.